නුවරඑළිය මහා නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 18 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ බැංකු ගිණුම් 02 ක හඳුනානොගත් ලැබීම් රු.707,503 ක්, ඉල්ලුම් තැන්පතු පොලී රු.59,069 ක් සහ බැංකු ගාස්තු රු.19,508 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂය තුළ නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභාව සතු කෞතුකාගාරයේ ඇති පැරණි ඡායාරූප සහ කෞතුක භාණ්ඩ 160 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර හෝ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම් තැබීමට කටයුතු කරමි. |
| (iii) | ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.32,590,125 ක් පුනරාවර්තන ලැබීම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ අයවැය කෙටුම්පත් සැකසීමේදී ප්‍රාග්ධන ලැබීම් අය ශීර්ෂයක් නිර්මාණය කර නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | රු.199,933 ක් වටිනා කල් ඉකුත්වී ඇති බටහිර ඖෂධ තොගයක් අවසන් තොග තුළ ඇතුළත්ව තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් අදාළ තොග ඉවත් කර නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩ කුලී ශේෂය තුළ දැනට කඩා ඉවත් කර ඇති කඩ කාමර 11 ක් සඳහා බිල්කර ඇති රු.14,315,850 ක අයකරගත නොහැකි මුදලක් ඇතුළත්ව තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරමි. |
| (vi) | ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද රු.120,375 ක මුදල ප්‍රාග්ධන ආදායම් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධන ආදායම් ලෙස නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්මවා තිබූ නොපියවූ අත්තිකාරම් ශේෂය රු.1,359,500 ක් විය. | ලැබිය යුතු ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ නිලධාරීන් සහ ආයතන දැනුවත් කර අත්තිකාරම් පියවීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.20,187,306 ක් විය. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 187 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.51,757,720 ක මුදලක් පෞද්ගලික වාණිජ බැංකුවක ස්ථාවර තැන්පත් ලෙසට ආයෝජනය කර තිබුණි. | අදාළ නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වනවිට පවතින ශේෂය රු.22,800,000 ක් වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂිකව කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, | | | |
| | (I) 189 හා 486 | 2014 – 2017 අතර කාලය තුළ අවස්ථා 07 කදී සභාවට ආදායම් වශයෙන් ලැබී අගරුවී තිබුණු චෙක්පත් 07 ක වටිනාකම රු.178,916 ක් අයකරගෙන නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම අගරු චෙක්පත්වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කරමි. |
| | (II) මුදල් රෙගුලාසි 571(3) | අවස්ථා 219 කදී තැන්පත් කර වසර 02 ක කාල පරාසයක් ඉක්මවා ඇති රු.5,911,275 ක් වටිනා තැන්පත් නියාදනය කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.134,594,992 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.118,906,163 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 95,692,651 | 83,604,526 | 57,163,626 | 81,606,048 | 99,068,258 | 86,939,615 | 84,830,288 | 94,065,436 |
| කුලී | 96,011,675 | 75,776,178 | 42,978,483 | 70,457,361 | 91,634,275 | 55,030,277 | 53,153,903 | 43,300,208 |
| බලපත්‍ර ගාස්තු | 24,411,786 | 18,300,742 | 16,306,462 | 2,082,780 | 23,572,000 | 20,787,120 | 19,900,958 | 1,421,860 |
| වෙනත් ආදායම් | 153,006,000 | 34,054,053 | 47,207,614 | 45,015,662 | 169,848,000 | 126,584,810 | 134,978,554 | 40,306,647 |
| | 369,122,112 | 211,735,499 | 163,656,185 | 199,161,851 | 384,122,533 | 289,341,822 | 292,863,703 | 179,094,151 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුළු හිඟ ආදායම වර්ෂය තුළදී සියයට 11.2 කින් හෙවත් රු.20,066,707 කින් ඉහළ ගොස් තිබුණි. | හිඟ ආදායම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අපේක්ෂිත ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.746,395 ක් හා මුද්දර ගාස්තු රු.33,639,258 ක් අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 අප්‍රේල් 30 දින වනවිට උසාවි දඩ රු.402,587 ක් හා මුද්දර ගාස්තු රු.10,680,860 ක් අය කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය ප්‍රකාර, ආඥා පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සෑදීම සහ ඒවා සංශෝධනය කිරීම සභාව විසින් කළයුතු වුවත්, අතුරු ව්‍යවස්ථා නොපැනවූ අවස්ථා 11 ක් විය. | සභාවට ආදායම් උපයාගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාර්යක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

(ඇ) පරිසර බලපත්‍ර

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ව) නියෝග අනුව, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් බලපත්‍රයක් ලබාගත යුතු වුවද සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 2020 අප්‍රේල් වන විටද එවැනි බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවට අයත් අක්කරයක පමණ වපසරියකින් යුතු බඹරකැලේ ගල්වළ 2008 දෙසැම්බර් 24 දිනැති බදු ඔප්පුව මගින් ව්‍යාපාරිකයෙක් වෙත වර්ෂයකට රු.26,500 ක මුදලකට බදු දී තිබුණි. බදු ගිවිසුමේ දෙවන උප වගන්තිය අනුව ගිවිසුම් කාලය 2012 දෙසැම්බර් 24 දිනෙන් අවසන් වන නමුත් ගල්වළ ආපසු පවරාගෙන නොතිබුණි. | අදාළ ඉඩම සහ ගල්වළ සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 217 වගන්තිය අනුව පදිංචිය සඳහා ඉඩම් බදු දීමේදී ඉඩමේ නොදියුණු වටිනාකමින් සියයට 4 ක වාර්ෂික බද්දක් අයකළ හැකි වුවද එසේ අය කිරීම් සිදු නොකර 2017 අගෝස්තු 25 දිනැති කොමසාරිස්වරයාගේ තීරණය අනුව, සභාව විසින් බදු දී ඇති ඉඩම් සඳහා රු.4,000 සිට රු.1,000 දක්වා විවිධ ගාස්තු අයකරමින් පැවතුණි. | අදාළ නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නියමිත පරිදි වැටුපෙන් නිවාස කුලී අය නොකිරීම හේතුවෙන් 2020 පෙබරවාරි 26 වන දිනට රු.141,388 ක හිඟ නිවාස කුලී අයවිය යුතුව තිබුණි. | අදාළ හිඟ නිවාස කුලී අය කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 43 ක පැවති පුරප්පාඩු 121 ක් සම්පූර්ණ කර නොතිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන සභා තීරණය යටතේ ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණු සේවකයින් 178 දෙනෙකු වෙනුවෙන් 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා වැටුප් ප්‍රතිපූර්ණය ලෙස රු.9,855,156 ක් මධ්‍යම පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අදාළ ආයතනය සමඟ කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්තිය අනුව, සභාවේ තාවකාලිකව සේවය කර තිබුණු, ස්ථාන මාරුවීම් ලැබූ, විශ්‍රාමික හා මියගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිළධාරීන්/ සේවකයින් 67 දෙනෙකුගෙන් වසරකට අධික කාලයක සිට අයවිය යුතුව පවතින ණය හා අත්තිකාරම් රු.2,198,261 ක් අයකර නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ණය අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 – 2017 අතර කාලය තුළ වාණිජ කටයුතුවලට අදාළව අනුමත කළ අයදුම්පත් 21 ක ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතික නිකුත් නොකෙරුණි. | සමීක්ෂණයක් සිදු කර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ 37(1)(ආ) වගන්තිය අනුව නගරය තුළ පිහිටි සියළුම වීථි සහ ඒවා අයත් පදික වේදිකාවන් මහා නගර සභාව සතු වුවත්, පැරණි බෙල්කඩ පිහිටි පරිශ්‍රයේ රථ වාහන නවතා තැබීමේ ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රවේශ පත්‍ර භාවිත කරමින් අයකරමින් තිබුණි. | මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අරමුදල් සංචිත ගිණුමේ පවතින රු.10,567,198 ක ශේෂය ඵලදායි ලෙස නගරයේ සංවර්ධන කටයුතු සඳහා | මෙම අරමුදල් නගරයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | යොදාගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 2009 තක්සේරුව පදනම් කරගෙන කඩ කාමර සඳහා බදු අයකරමින් පැවතුණි. | නව බදු කුලී තක්සේරුවක් සිදු කර ඒ අනුව සභාවේ ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගෙන ඇත. |

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට ට්‍රේලර් සහිතව ට්‍රැක්ටර් රථ 02 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පදාන ක්‍රියාවලියේදී, අනෙකුත් සියළු සුදුසුකම් සපුරා තිබූ ලංසුවක්, ලංසු සුරක්ෂණ කාලය දින 05 ක් ප්‍රමාදවීම මත ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සභා අරමුදලට 2,215,000 ක පාඩුවක් සිදුව තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 4 කට අධික කාලයක සිට රු.3,157,500 ක් වටිනා වාහන 05 ක් ධාවනයෙන් ඉවත්කර නිශ්කාර්යව පැවතුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

3.7 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නුවරඑළිය ග්‍රෙගරි උද්‍යානයේ ඉදිරිපිට උඩුපුස්සැල්ලාව මාර්ග රක්ෂිතය සහ ඇළ රක්ෂිතයට මැදිව පිහිටි පර්චස් 3.2 ක රජය සතු ඉඩම මහා නගර සභාවේ ඉඩමක් සේ සලකා 2017 අගෝස්තු 25 දිනැති අංක 971 දරන තීරණය අනුව 2017 සැප්තැම්බර් | අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

07 දින වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කර තිබුණි. තවද, මෙම භූමියේ පවත්වාගෙන යන අනවසර ඉදිකිරීම 2020 මාර්තු වනවිට ඉවත් කර නොතිබුණි.

3.8 ප්‍රසම්පාදනය
--------------

කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | -------------------------- |
| (අ) | රුපියල් මිලියන 9.516 කට ඇස්තමේන්තු කළ බෲවරි ගැමුණු මාවත ජල පිරිපහදු පද්ධතියේ ඉදිකිරීමට යෝජිත ඉඩම නිරවුල් කරගෙන නොතිබියදී, ලංසු කැඳවා ලංසුකරුවන් තෝරා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණ ද ඉදිකිරීම් භූමිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිදහස් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරිමට නොහැකිවී තිබුණි. මෙම ප්‍රසම්පාදන කටයුතු සඳහා පුවත්පත් දැන්වීම් වෙනුවෙන් දැරූ රු.160,712 ක වියදම ද නිෂ්ඵල වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. අදාළ ඉඩම පවරාගෙන සංවර්ධන කටයුතු සිදු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | නුවරඑළිය ගොල්ෆ් පිටිය වටා ඇවිදින මංතීරුවක් ඉදිකිරීමේ කර්මාන්තය 2019 වසන්ත සැණකෙළියට පෙර කළ යුතු හදිසි කටයුත්තක් සේ සලකා අදියර 08 ක් යටතේ මිල ගණන් කැඳවා (Package ක්‍රමයට) කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකු ලවා ඉක්මනින් වැඩ නිම කරවා ගැනීමට අවශ්‍ය බව තීරණය කර තිබුණ ද, 2019 ජූලි මස 18 දින වන විටද I, II, III, VII අදියරවල වැඩ නිමකර නොතිබුණි. එමෙන්ම රු.20,288,757 ක වටිනාකමැති මෙම ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් සිදු නොකර සීමිත තරඟකාරී ලංසු කැඳවීමක් සිදුකර තිබීම හේතුවෙන් ඉදිකිරීම සඳහා තරඟකාරී මිලක් ලබා ගැනීමට තිබුණු අවස්ථාව ගිලිහී ගොස් තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉතා හදිසි වූ සහ ඉතා විශේෂ වූ කරුණක් ලෙස සලකා ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරව 2017 වර්ෂයේ අප්‍රේල් වසන්ත සැණකෙළියේ අවශ්‍යතාවයන් සඳහා රු.2,993,335 කට මිලදීගෙන තිබුණු කන්ටේනර් වැසිකිළි දෙකක් 2020 වන විටද ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | කන්ටේනර් වැසිකිළි දෙක ප්‍රයෝජනයට ගත හැකි පරිදි ඉතිරි කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | ග්‍රෙගරි වැව අංක 1 උද්‍යානයේ බෝට්ටු නිවාස අසල වැසිකිළිය අළුත්වැඩියාවේදී, උද්‍යානයේ ඇවිදින මංතීරුවට බරවාහන ඇතුළත් කිරීම හේතුවෙන් මාර්ගය ගිලා බැසීම සහ විනාශ වීම සිදුව තිබුණි. | හානියට අදාළ වටිනාකම වගකිවයුතු අයගෙන් අයකරගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |